# සීතාවක පුරාණය



# ආඬි ගුරුවරු - අරිට්ට කී වෙණ්ඩු පෙරුමාල්

සීතාවක ගැන කතා කරන විට කාගේත් සිහියට නැගෙන පිරිසකි, ආඬිගුරුවරු ඒ අතර අරිට්ට කී වෙණ්ඩු පෙරුමාල් නම් වඩක්ක යාට (වඩුගයා) මුල් තැනක් හිමි වේ. පෙර සිටම දකුණු ඉන්දියානුවෝ විවිධ මුහුණුවරින් ලක්දිවට සංක්‍රමණය වූහ. ආක්‍රමණිකයන් හැටියට සමහරු ආහ. සමහරු මිත්‍ර වේශයෙන් පැමිණියහ. රජුගෙ උපදේශකයන් වශයෙන්ද බිසෝවරුන් වශයෙන්ද ඔවුන්ගේ ඥාතීන් හැටියටද සමහර ද්‍රවිඩයෝ මෙහි සංක්‍රමණය වූහ. රජවරු දඬුවම් වශයෙන් දකුණු ඉන්දීය ද්‍රවිඩයන් දහස් ගණන් මෙහි ගෙන අවුත් වැව් බැඳීම් ආදී කාර්යයන්ට හවුල් කර ගත්හ. පොළොන්නරු අවධියෙන් පසු මෙම සංක්‍රමණිකයෝ වඩා බලවත් වූහ. සොළී, පාඬි, කේරළ ජාතීන් පමණක් නොව කාලිංග, පල්ලව වැනි දෙස් විදෙස් වලින්ද පැමිණ ඇත. මේ නිසාම විශේෂයෙන් ද්‍රවිඩ විරෝධී හැඟීම්ද ලක්වැසියා අතර පැවතුණි. දසවන සියවස ට අයත් බදුලු ටැම් ලිපියේ

"දෙමළුනට රට නා තැන් දරු අවා නොදෙනු ඉසා"

යනුවෙන් සඳහන් වේ. සමහර පාලකයනට පුරෝහිතකම් කළේද ඉන්දියානු බමුණන්ය. ජයවර්ධන පුර ශ්‍රී පරාක්‍රමබාහු රජතුමා ඔරුවල "බණගම" තඹ සන්නසින්

"බමුණු පොතා ඔජකඩලුන් හා බ්‍යාණ අවුහල ඔජකඩලුන් " යන දෙදෙනාට පුරෝහිත තේවාව සඳහා දුන් දීමනාවක් ගැන කියවේ. මහ පැරකුම් සමයට අයත් බුදු මුත්තාව ටැම් ලිපියේ "පාණ්ඩියනාර් වීර පෙරුමාල්" නමැත්තකු ගැන සඳහන් වේ. උම්මග්ග ජාතක කථාවෙන් උපහාසයට ලක්කොට ඇත්තේ මෙබඳු පුරෝහිත බ්‍රාහ්මණයන් පස් දෙනෙකි. ඔවුන් හා ලක්දිව ගොවි කුලයේ ඇත්තන් අතර ගැටුමක් එයින් පැහැදිලි කරයි. ගොවියා පුතු මහෞෂධයන්ගේ ප්‍රභූ මහිමය මතු කොට පෙන්වීමත් බමුණු පඬිවරුන්ගේ මෝඩකම් හුවා දැක්වීමත් උම්මග්ග ජාතකයේ අරමුණයි. කාලිංග නිශ්ශංක මල්ල රජු සිය ඇතැම් සෙල්ලිපි වලින් ගොවි කුලයේ ඇත්තන් රජකම නොපැතිය යුතු බවට අභියෝගයක් කර ඇත. රජ කුලයේ අය මෙහි නැත්නම් රජකමට එබඳු අය දඹදිවින්වත් ගෙන්වා ගන්නා ලෙස ඔහුගේ සෙල්ලිපි වලින් අනුශාසනා කරයි.

"පොළොන්නරු බලකොටුවේ උතුරු වාසලේ පුවරු ලිපිය නිදසුන් වේ."

"කණ මැදිරියා සූර්ය ප්‍රභාවයටද, වටුවා හස්තීන්ටද කැනහිලා සිංහයන්ටද භාව කරන්නාසේ ගොවි කුලෙහි ඇත්තන් රාජ ලීලාවට නොපැතුව මැනවැ ගොවි කුලෙහි ඇත්තෝ රාජ්‍යයට බලානොගත යුත්තාහ."

දේවාලවල යම් යම් නිල කටයුතු සඳහාද සමහර ද්‍රවිඩ බමුණු පිරිස් පැමිණ ඇත. දෙවුන්දර පුවරු ලිපියේ

"අතපත්තු ආරච්චි වෙණ්ඩරස කොණ්ඩ පෙරුමාලුත්" ගැන සඳහන් වේ. ඇතැම් අවස්ථාවල මැණික් ගැරීම, නිධාන් සෙවීම වැනි කටයුතු සඳහාත් යන්ත්‍ර මන්ත්‍ර විධි සඳහාත් සන්‍යාසී වෙසින් පැමිණි අයද වූහ.

සිංහලයන් අතර ප්‍රචලිත දේව කථා අතරද මෙබඳු ඉන්දීය සම්භවයන් ඇති සංක්‍රමණික දේවතාවන් ගැන කියැවේ. දෙවොල් ගොඩ බැසීම එබඳු අවස්ථාවකි. කුහර පුර රාමසිංහ රජුගේ දරුවන් සත් දෙනෙක් රට වැසියනට හිරිහැර වන පරිදි කටයුතු කර ඇත. මිනිස්සු කෝප වී රජුට පැමිණිලි කළහ. රජු මේ කුමාරවරු රටෙන් පිටමන් කළේය. ඔවුහු සත්සියයක් පිරිවර කැටිව නැව් සතක නැගී සමුද්‍ර තරණය කළහ. ඔවුන්ගේ පිරිවරට ද්‍රෙලුවර, කණ්ණාඩි, කාවිසි, යොන්පුර, අරමණ, කෝෂි මුක්කර පලවර පිල්ලි, කුරුම්බර, වඩිග, කල්ලු දෙමළ, ගුර්ජර්, වඩක්ක ආදීහු වූහ. මේ නැව් මුහුදේදී කැඩී බිඳී ගිය බැවින් පිහිනා ලංකාවට ගොඩ බසින්නට ආහ.

"කඹත් කුඹත් රුවලත් බිඳී ගිය තැන
ලොබත් කෙරෙයි කඩ ලෑලි බදා ගෙන
ගොඩත් බලා යන්නට බැරිවන තැන
කඹත් කුඹත් රුවලත් දැක පීනන"

"දෙවොල් අලංකාරය"

පානදුරයට ගොඩ බසින්නට ආ නමුත් අවහිරතා ඇතිවිය. ඊට පසු පලටු පානේදී ද ගොඩ බසින්නට මිනිස්සු ඉඩ නුදුන්හ. සීනිගම හරියේදී පිහිනා ගොඩට එනවිට පත්තිනි දෙවියෝ ගිනි වැටක් මැවූහ. ඒ ගිනි අතරින් දෙවොල් දෙවියෝ පිරිස සමඟ ගොඩට ආහ.

"දෙවොල් දෙවි මෙපු රට
ගොඩ බැස පාන දුර යට
සීනිගම් වෙරළ ට
එදා අනුසස් පාපු විල සට
තෙද දෙවොල් එම විට
ගිනිජල් පතිනි ගල සිට
ගිනි සලඹ සුරත ට
රැගෙන ගැසුවයි මුදු ජල පිට"

"දෙවොල් ගොඩ බැසීම"

දෙවොල් ගොඩ බැසීමත් විජයාගමණයත් යන සිද්ධීන් දෙකෙහි ඇති සාම්‍යත්වය කෙරෙහිද අවධානය යොමු කිරීම වැදගත්ය. මුලදී විජයගේ පැමිණීමට කුවේණිය විරුද්ධකම් පෑවාය. එමෙන්ම දෙවොල් ගොඩ බැසීමට පත්තිනි දේවියගේ විරුද්ධවාදිකම් ඇතිවිය. එහෙත් දෙදෙනාගේම බලය පසු කාලයේදී මෙහි තහවුරු විය.

"දොළහ දෙවියන්ගේ කවි" වල කියවෙන පිටියේ දෙවිඳුද සොළී කුමරෙකි.

"වඩින්ට සොළී රජ සිත කරුණා කොට
වඩිග දෙමළ ගුරුවර පිරිවර කොට
කොඩිය ගෙනත් සිටුවාලා නැව පිට
වැඩියයි පිටියේ දෙවියෝ අසු පිට "

"මායාදුන්නේ රජ්ජුරුවන් කෝලි කුට්ටුවෙන් වඩක්කරුන් ගෙන්වා කුඩලි මරක්කලයන් ඇතුළුව නිලමක් කාරයින් දෙන්නාත් බොහෝ වඩක්කරුනුත් සීතාවකට ගෙන්නවා යුද්ධය ආරම්භ කළාහ."

"මායාදුන්නේ රජ්ජුරුවෝ කෝට්ටයට පණිවුඩ යවා සන්තානයට කථා කළ විට වඩක්කරුන් දුරුකළවිට සන්තාන වෙනවාය කියා භුවනෙකබාහු වදාර එවූ නිසාත් වඩක්කරුන් ගේ අවගති නිසාත් මුන්නිල වඩක්කරුන් දෙන්නාත් අල්ලා බැඳලා කෝට්ටේ නුවරට එවා සන්තාන උනාහ."

"රාජාවලිය"

මායාදුන්න ගේ හමුදාව වඩුග දෙමළුන්ගෙන් යුක්ත වූ බව මෙයින් පැහැදිලි වේ. වීර මුණ්ඩ හා රත්න කම්බිලි දෙවි වරුන්ද ඉන්දීය සම්භවයක් ඇත්තෝ වූහ.

"මල්වර දෝසෙන් කම්බිලි උපතකි මම දන කියන්ඩ
සිල්වාරන් දවසක් ඇර දේසේ සිට ගොඩ බසින්ඩ
කල් පවතින රට අල්ලා කම්බිලි දෙවි වැඩ සිටින්ඩ
ගල් නැව මුහුදේ සිඳුයට තිබුනා දැක මතු කරන්ඩ "

(රත්න කම්බිලි කෝල් මුරය)

ඔඩ්ඩිස කුමරු හෙවත් ඔඩ්ඩි මස්සිනා ද වඩුග දේශයෙන් පැමිණියෙකි. අභිමාන යකෂාද ඔඩ්ඩි දේශයේ කවිසි රට රාජගුරු රාජ නමැත්තෙකුට දාව ආඬි මවකගේ කුසෙන් උපන්නෙකි. සොකරි නාඩග මේ උපහාසයට ලක් වන්නේද ආඬි ගුරුවරයෙකි. අපේ ලඳුන් දරුවන් නැලවූයේ ආඬින්ට, බිල්ලන්ට, සන්නාසීන්ට බිය කරවමින්ය.

"අතුරු මිතුරු දඹ දිවතු-රු - රාජකපුරු සෙට්ටියා
වරාගසට ගියෙන්බොලන් - පුහු කලටිය නෙලිම් බොලන්
අළුත ගෙනා මනමාලී - හාල් පතක් ගරාලා
බටු කොරහක් කපාලා - ඉහළ ගෙටත් බෙදාලා
පහළ ගෙටත් බෙදාලා - අතක් ගනින් යාළුවේ"

කුඩා ළමුන්ගේ මේ ක්‍රීඩාවට ද ආඬි ගුරුන් ගෑවී ඇත. මැණික් ගැරුවෝ මුක්කරුය, දරුවන් හොරෙන් ගෙන ගොස් නිධාන් සෙව්වෝ සන්නාසී බිල්ලෝය.

ගුරු පස්ගොඩ ගුරුගල්ල, ගුරු බැවුල, ආඬි අම්බලම, ආඬියාමලතැන්න, ආඬිගල, ආටිගල, හෝමාගම, පිළියන්දල (බිලි+කම්+දොළ) ආදී ගම් ආඬි ගුරුන් යම් යම් කාර්යයන්හි නිරත වූ තැන්ය. මහනුවර යුගයේදී ආඬිමාලය නමින් ග්‍රන්ථයක්ද ලියවී ඇත. අද දක්වාත් මානියම්ගම දුරුතු පෙරහරට ආඬි වෙස් ගත්තෝ සහභාගී වෙති. "ආඬි හත්දෙනා කැඳ ඉවූ හැටි" සිංහලයන් අතර ප්‍රචලිත ජන කථාවකි.

මෙසේ ලංකාවේ වඩුග බලපෑම සෑහෙන කලක සිට වර්ධනය වෙමින් පැවති බවත් ඒවා නොඑක් මුහුණු වරින් ලාංකික ජන ජීවිතය හා මුසු වුන බවත්, සීතාවක අවධියේදී හා ඊට පසුවත් වඩා ප්‍රබල අන්දමින් පැතිරී ගිය බවත් මේ කරුණු වලින් පැහැදිලි වනු ඇත.

අරිට්ට කී වෙණ්ඩු පෙරුමාල් ජයවීර හා මනම්පෙරුම මොහොට්ටාල යන නමින් ද හැඳින්වුණු ආඬිගුරු නායකයෙකි. වඩක්ක (වඩුග) යෙකි. තවත් සන්‍යාසී පිරිසක් සමඟ ලක්දිවට පැමිණ මොහු සීතාවක රාජසිංහයන්ට අග්‍ර පුරෝහිත වශයෙන් ද කටයුතු කළේ රජතුමා භික්ෂූන් වහන්සේලා සමඟ අමනාපයෙන් සිටියදීය. යුද කටයුතු වලදී පවා මොහු රජුට උදව් විය. රජු මොහුට ශ්‍රීපාද ස්ථානයේත් හෙරණ්ඩි දෙවොලේත් පාලනය භාර දුන්නේය. අවස්ථාවාදී මොහු ශිවාගම පතුරුවන්නට ක්ෂේත්‍රය සකස්කර ගති. පෙර පැවති වෛශ්නව ඇදහිල්ල යටපත්වී ශිව පිළිබඳ විශ්වාසයට මුල්තැන ලැබෙන්නට විය. උපුල්වන්, සීතා, බිරාඩී, පත්තිනි වෙනුවට හර හරඟන ඉස්මතු වන්නට විය. පුද පූජා වෙනුවට බලි බිලි පැතිර යන්නට විය.

රාජසිංහ රජුගේ මරණයෙන් පසු මොහු රාජ සූර්ය කුමරු මරවා රාජ්‍යය ගැනිමට ද උත්සාහ කළේය. ඒ අවස්ථාවේදී මහ අතපත්තු නමැත්තා මොහු උපහාසයට ලක් කරමින් කවි ලියා සීතාවක නගරයේ ප්‍රසිද්ධ කළ බවත් සඳහන් වේ. ඉක්බිති ජයවීර බණ්ඩාර නමින් ප්‍රසිද්ධව පෘතුගීසීන් වෙත ගොස් ඇත. එහිදී කොප්පු බණ්ඩාර ගේ උපායශීලී ක්‍රියා මාර්ගයක් නිසා පෘතුගීසීන් අතින්ම මරණයට පත්විය. සිංහල රාජ වංශය අවසන් වූයේද වඩුග යන්ට ලංකාවේ රජකම හිමි වීමෙනි. එබැවින් වඩුඟ, වඩක්ක, ආඬි සන්‍යාසී ආදී නම්වලින් හැඳින්වුණු දකුණු ඉන්දීය සංක්‍රමණිකයන් නිසා සිංහලයන් ගේ අභිමානවත් අතීතය කෙමෙන් ගිලිහී ගොස් යුරෝපීයයන්ට රට අයිති වී විශාල පරිහානියකට ඇද වැටුණු බව පැහැදිලිය.

මනම්පේරී, මාන්නප්පෙරුම, පද්මපෙරුම, සම්බන්ධ පෙරුම, පොන්නම් පෙරුම වැනි පෙලපත් නාමයෙන් වඩුග කුමාර වරුන් ගේ නම් හා සැසඳෙන අන්දම විමසිය යුත්තකි. මෙසේ අනාදිමත් කාලයක් තුළ ඉන්දියාවේ විවිධ ප්‍රදේශවලින් විවිධ මුහුණුවරින් මෙහි ආ සංක්‍රමණිකයෙන් ලංකා සමාජය තුළ මුල් බැසගෙන ඇති අන්දම පැහැදිලිය.



ශාස්ත්‍රවේදී
නා. ලි. සාර්ලිස් අමරසිරි

